# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2197/11 - 2020 ඔක්තෝබර් මස 13 වැනි අඟහරුවාදා - 2020.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KIDS/LND/01/ACQ/06.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

මහජන කටයුත්ත කුමක්ද යන වග : කිරිඇල්ල විදාතා සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා.

*අත්කරගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ උතුරු උඩපත්තුවේ කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉඩංගොඩ ග්‍රාම නිලධාරි වසමේ රත්නපුර මිනුම් අධිකාරි විසින් පිළියෙල කළ අ. ග. පි. 182, අති 39, පත්‍ර 36 හි ලොට් 742, 743, 744 ඉඩම් කැබලි.

**01. අ. ග. පි. 182, අති 39, පත්‍ර 36 හි ලොට් 742**

ඉඩමේ නම: ඉඩංගොඩ වත්ත; හිමිකම් කියන අය: සී/ස බලංගොඩ වතු සමාගම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0026

**02. අ. ග. පි. 182, අති 39, පත්‍ර 36 හි ලොට් 743**

ඉඩමේ නම: ඉඩංගොඩ වත්ත; හිමිකම් කියන අය: සී/ස බලංගොඩ වතු සමාගම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.1497

**03. අ. ග. පි. 182, අති 39, පත්‍ර 36 හි ලොට් 744**

ඉඩමේ නම: ඉඩංගොඩ වත්ත; හිමිකම් කියන අය: සී/ස බලංගොඩ වතු සමාගම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0050

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 නොවැම්බර් මස 17 වැනි දින පෙ. ව. 10.00 ට කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 නොවැම්බර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ජේ. එල්. සී. කීර්ති ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කිරිඇල්ල.

2020 ඔක්තෝබර් මස 05 වැනි දින,
කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-1074



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*